ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය
Business & Accounting Studies

**81 | S | I**

# අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) තරග විභාගය 2005 ජුලි
**கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2005 டிசெம்பர்**
Genaral Certificate of Education (Ord. Level) Examination, July 2005

**ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I**
**வணிகக் கல்வியும் கணக்கீடும் I**
**Business and Accounting Studies I**

පැය එකයි
*One hour*

සැලකිය යුතුය :

(i) සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
(ii) 1 සිට 40 තෙක් ප්‍රශ්න වල දී ඇති (1), (2), (3), (4) පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා ගන්න.
(iii) ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරා ගත් පිළිතුරට අදාල අංකය හා සැසඳෙන කවය මත (X) ලකුණ යොදන්න.
(iv) එම උත්තර පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද පරිස්සමෙන් කියවන්න.

---

01. "ව්‍යාපාර" යන්නෙහි අර්ථය වඩා හොඳින් ප්‍රකාශ වන්නේ,
(1) ලාභ ලැබීමේ අරමුණින් කරන ඕනෑම කටයුත්තකි.
(2) මිනිස් අවශ්‍යතා හා වුවමනා සපුරාලීමේ ඕනෑ ම කටයුත්තකි.
(3) මිල දී ගැනීම හා විකිණීම සම්බන්ධ වූ ඕනෑ ම කටයුත්තකි.
(4) භාණ්ඩ හා සේවා හුවමාරුව පිළිබඳ වූ ඕනෑ ම කටයුත්තකි.

02. වෙළඳාම ආරම්භ වූයේ,
(1) භාණ්ඩ හුවමාරුව ක්‍රමය තුළිනි. (2) විශේෂීකරණය තුළිනි.
(3) මුදල් ක්‍රමය තුළිනි. (4) කාර්මිකකරණය තුළිනි.

03. අවසාන පරිභෝජනය සඳහා භාණ්ඩ හා සේවා විකිණීම කරන්නා,
(1) නිෂ්පාදකයා ය. (2) තොග වෙළෙන්දා ය.
(3) නියෝජිතයා ය. (4) සිල්ලර වෙළෙන්දා ය.

04. ශ්‍රී ලංකාවේ තේ වැඩි ප්‍රමාණයක් මිල දී ගන්නා රට වන්නේ,
(1) පකිස්ථානය (2) ප්‍රංශය (3) ඉරාකය (4) ජපානය

05. සාමාන්‍යයෙන් විශාල ප්‍රාග්ධනයක් එක්රැස් කරගත හැකි ව්‍යාපාර සංවිධාන ක්‍රමය වන්නේ කවරක් ද?
(1) හවුල් ව්‍යාපාරය (2) සමුපාකාර සමිතිය
(3) සීමිත පෞද්ගලික සමාගම (4) සීමිත පොදු සමාගම

06. ආනයනකරුගේ කාර්යයක් නො වන්නේ,
(1) ඉන්ඩෙන්ටුව පිළියෙල කිරීම (2) ණයවර ලිපිය විවෘත කිරීම
(3) නෞභාර පත යැවීම (4) රේගු හා ආනයන තීරු ගාස්තු ගෙවීම

07. ව්‍යාපාර සංවිධාන පෞද්ගලික හා පොදු අංශ වශයෙන් වර්ගීකරණය කරනු ලබන පදනම වනුයේ,
(1) ව්‍යාපාරයේ අරමුණ අනුව ය.
(2) ලාභාලාභ බෙදාගන්නා ක්‍රමය අනුව ය.
(3) කළමනාකරණයට සහභාගිවන ආකාරය අනුව ය.
(4) හිමිකාරත්වය (අයිතිය) අනුව ය.

08. ගබඩාකරණයේ ප්‍රධාන අරමුණ වනුයේ,
(1) භාණ්ඩ සඳහා ඇති ඉල්ලුම හා සැපයුම අතර සමතුලිතතාව පවත්වාගෙන යෑම.
(2) භාණ්ඩවල ගුණාත්මකභාවය වර්ධනය කිරීම.
(3) ඵලදායීතාව වැඩි කිරීම.
(4) නිෂ්පාදන පිරිවැය අඩු කිරීම.

09. රක්ෂණ මූලධර්මයක් නොවන්නේ,

(1) උපරිම විශ්වාසය (2) රක්ෂණ හිමිකම

(3) හානිපූර්ණය (4) රක්ෂණයේ වටිනාකම

10. පාරිභෝගික අයිතිවාසිකමක් නොවන්නේ,

(1) ආරක්ෂාව සලසා ගැනීම. (2) තොරතුරු ලබා ගැනීම.

(3) සමාජය ගැන සැලකිලිමත් වීම. (4) අවධානය යොමුකරවා ගැනීම.

11. ලාභාංශ ප්‍රමාණය නිශ්චිතව සඳහන් කෙරෙන කොටස් වර්ගය වනුයේ,

(1) සාමාන්‍ය කොටස් (2) වරණීය කොටස්

(3) ප්‍රසාද කොටස් (4) ආදි කර්තෘ කොටස්

12. ව්‍යවසායකත්වය යනු,

(1) ව්‍යාපාරයක් පවත්වාගෙන යෑම යි. (2) අවදානම් දැරීම යි.

(3) නවෝත්පාදන මඟින් වෙනස්කම් ඇති කිරීම යි. (4) ව්‍යාපාර කළමනාකරණය යි.

13. ව්‍යාපාර කටයුතුවලට බලපෑම් ඇති කරන ජීවන වියදම, වැටුප් මට්ටම, ජාතික ආදායම, උද්ධමනය ආදී සාධක ක්‍රියාත්මක වන ව්‍යාපාර පරිසරය වන්නේ,

(1) සමාජ හා සංස්කෘතික පරිසරය යි. (2) තාක්ෂණික පරිසරය යි.

(3) නෛතික පරිසරය යි. (4) ආර්ථික පරිසරය යි.

14. ආනයන භාණ්ඩ තොගවලට හිමිකම් පෑම සඳහා භාවිත කෙරෙන ලියවිල්ල වන්නේ,

(1) ඉන්ඩෙන්ටුව යි. (2) ආනයන බලපත්‍රය යි.

(3) නෞභාරපත්‍ර යි. (4) ප්‍රභවස්ථාන සහතිකය යි.

15. රේඛිත චෙක්පතක් සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) පැවරිය නොහැකි ය. (2) විධාන චෙක්පතකි.

(3) භාරක චෙක්පතකි. (4) ජංගම ගිණුමක තැන්පත් කළ යුතු ය.

16. චෙක්පතක චුම්භක තීන්ත අක්ෂර හැඳුනුම් තීරුවේ ප්‍රථමයෙන් සඳහන් වී ඇති අංක කාණ්ඩයෙන් දැන ගත හැකි වැදගත් තොරතුර කුමක් ද?

(1) චෙක්පතේ අංකය (2) ජංගම ගිණුම් අංකය

(3) බැංකු ශාඛාවේ අංකය (4) බැංකුවේ අංකය

17. මිනිස් උවමනාවන් පිරිමැසීම සඳහා යොදා ගන්නේ,

(1) මුදල් හා භාණ්ඩ (2) භාණ්ඩ හා සේවා

(3) ආහාරපාන, ඇඳුම් (4) මුදල් හා ආහාර

18. ප්‍රධානියා වෙනුවෙන් භාණ්ඩ එකතු කිරීම, ඇහිරීම, භාණ්ඩ ගෙන ගොස් භාරදීම යන කාර්යයන් කරන නියෝජිතයා වන්නේ,

(1) ප්‍රේරක නියෝජිතයා (2) කොමිස් නියෝජිතයා

(3) වෙන්දේසිකරු (4) සාධ්‍යකයා

19. දී ඇති වරණවලින් අන්තරාල වෙළඳාම හැඳින්වීමට සුදුසු වරණය වන්නේ,

(1) ආනයනයෙන් පසු භාණ්ඩයේ යම්යම් වෙනස්කම් කර විදේශයකට විකිණීම

(2) භාණ්ඩය බන්ධිත ගුදමේ තබා ස්වදේශීය තොග වෙළඳුන්ට විකිණීම

(3) භාණ්ඩය වරායේදී ම සිල්ලර වෙළඳුන්ට විකිණීම

(4) ආනයනයෙන් පසු වෙනසක් නොකර විදේශයකට විකිණීම

20. ධාරක චෙක්පතක් ලිවීමේ දී ආදායකයාගේ නමට ඉදිරියෙන් දැක්විය යුත්තේ,

(1) "රැගෙන එන්නාට" යනුවෙනි. (2) "අණ පරිදි" යනුවෙනි.

(3) "ගිණුමට පමණි" යනුවෙනි. (4) "ලංකා බැංකුව" යනුවෙනි.

21. පහත සඳහන් සිද්ධීන්ගෙන් කුමක් ගිණුම් පොත්වල වාර්තා කෙරෙන්නේ ද?

(1) ව්‍යාපාරික ස්ථානයක් තෝරා ගැනීම (2) කළමනාකරුවෙකු බඳවා ගැනීම

(3) ණයට බඩු ගැනීමට තීරණය කිරීම (4) ව්‍යාපාරික ස්ථානයේ කුලිය ගෙවීම

22. ගොඩනැගිලි අලුත්වැඩියාව සඳහා වූ රු. 2000 පොත්වල සටහන් කර ඇත්තේ,

ගොඩනැගිලි ගිණුම හර රු. 2000

මුදල් බැර රු. 2000 වශයෙනි.

මෙම වැරදි ද්විත්ව සටහන හඳුන්වන්නේ,

(1) ඌනතා දෝෂයකි. (2) හිලව් දෝෂයකි.

(3) මූලධර්ම දෝෂයකි. (4) අතිරික්තතා දෝෂයකි.

23. ශේෂ පිරික්සුම පිළියෙල කිරීමේ ප්‍රධාන අරමුණ වන්නේ,

(1) ද්විත්ව සටහන්වල නිවැරදිතාව තහවුරු කර ගැනීමයි.

(2) ගණිතමය නිවැරදිතාවය තහවුරු කර ගැනීමයි.

(3) ලාභාලාභ තහවුරු කර ගැනීමයි.

(4) වත්කම් හා වගකීම්වල අගය තහවුරු කර ගැනීමයි.

24. ණයට විකුණන භාණ්ඩ පිළිබඳ විස්තර දක්වමින් විකුණුම්කරු විසින් ගැනුම්කරු වෙත එවන ලියවිල්ලකි.

1. ලදුපත 2. ඉන්වොයිසිය

3. හරපත 4. බැරපත

25. සුළු මුදල් පොතක් පවත්වා ගැනීමෙන් බලාපොරොත්තු ව මූලික අරමුණ වන්නේ,

(1) නීතිමය අවශ්‍යතාවක් සම්පූර්ණ කිරීම

(2) සුළු මුදල් ගනුදෙනු විධිමත් කිරීම

(3) ප්‍රධාන මුදල් හා සුළු මුදල් ගනුදෙනු හඳුනාගැනීම

(4) ව්‍යාපාරයේ කාර්යයන් වර්ග කිරීම

26. පහත සඳහන් ගනුදෙනු අතරින් විකුණුම් ජ්නලයේ සටහන් කළ යුතු ගනුදෙනුව වන්නේ,

(1) ස්ථාවර වත්කම් ණයට විකිණීම (2) භාණ්ඩ අත්පිට මුදලට විකිණීම

(3) භාණ්ඩ ණයට විකිණීම (4) භාණ්ඩ අත්පිට හා ණයට විකිණීම

27. ව්‍යාපාරිකයෙකුට අවශ්‍ය යන්ත්‍ර සූත්‍ර, වාහන වැනි ප්‍රාග්ධන වත්කම් ලබා ගැනීම සඳහා මූල්‍ය පහසුකම් සපයන ආයතනය

(1) කාර්මික සංවර්ධන මණ්ඩලය (2) කල්බදු සමාගම්

(3) සේවක භාරකාර අරමුදල (4) ආයෝජන මණ්ඩලය

28. මුදල් පොත සංශෝධනය කිරීමේදී බැංකු ප්‍රකාශයෙන් උපුටාගත යුතු අයිතමයක් වන්නේ,

(1) තැන්පත් කර ඇතිමුත් නිෂ්කාශණය නොවූ චෙක්පත්

(2) ස්ථාවර නියෝග මත කර ඇති ගෙවීම්

(3) නිකුත් කළ නමුත් ගෙවීම් සඳහා ඉදිරිපත් නොවූ චෙක්පත්

(4) බැංකුවේ සිදුව ඇති ලිපිකාර දෝෂ

29. චෙක්පත් මඟින් ගෙවීම් කල හැකි බැංකු ගිණුම වනුයේ,

(1) ඉතිරි කිරීමේ ගිණුම (2) ස්ථාවර තැන්පත් ගිණුම

(3) බැංකු ණය ගිණුම (4) ජංගම ගිණුම

30. මොරටු ලී බඩු සමාගම සතියක් තුළ දී මේස 10 ක් නිපදවීය. ඊට අදාළ පිරිවැය මෙසේය.

මුළු සෘජු පිරිවැය රු. 3000.00

මුළු පොදු කාර්ය පිරිවැය රු. 1000.00

එසේ නම් මේසයක මුළු පිරිවැය වනුයේ,

(1) රු. 300 (2) රු. 200 (3) රු. 400 (4) රු. 100

31. මුදල් වට්ටම් දෙනු ලබන අවස්ථාව වන්නේ,

(1) මුදලින් ගෙවා භාණ්ඩ මිලට ගන්නා විට ය. (2) පසුව ගෙවීමේ පදනම මත භාණ්ඩ මිලට ගන්නා විට ය.

(3) එකඟ වූ කාලය තුළ ගෙවීම් පියවන විට ය. (4) චෙක්පත්වලින් ගෙවීම් පියවන විට ය.

32. චෙක්පතක් අගරු වී බැංකුවෙන් ආපසු ලැබුණු විට, ව්‍යාපාරය කළ යුතු ද්විත්ව සටහන කවරක් ද?

(1) ණය ගැති ගිණුම හර, අගරු චෙක්පත් ගිණුම බැර

(2) අගරු චෙක්පත් ගිණුම හර, ණය ගැති ගිණුම බැර

(3) මුදල් පොතේ බැංකු ගිණුම හර, අගරු චෙක්පත් ගිණුම බැර

(4) අගරු චෙක්පත් ගිණුම හර, මුදල් පොතේ බැංකු ගිණුම බැර

33. මාසික බැංකු ගිණුම් විස්තරය ලැබෙන තෙක් ව්‍යාපාරය තම මුදල් පොතේ නොලියන සටහන් වන්නේ,

(1) නිකුත් කළ චෙක්පත්වල වටිනාකම

(2) තැන්පත් කළ චෙක්පත්වල වටිනාකම

(3) බැංකුව වෙත ලැබී ඇති සෘජු ලැබීම්වල වටිනාකම

(4) බැංකු අගරු කළ චෙක්පත්වල වටිනාකම

34. සුළු මුදල් ප්‍රතිපූර්ණය යනුවෙන් හඳුන්වන්නේ,

(1) සුළු මුදල් භාරකරුට මසකට මුදල් ප්‍රමාණයක් භාර දීම.

(2) සුළු මුදල් භාරකරුට මාසයේ වියදම් කළ මුදලට සමාන මුදලක් භාර දීම.

(3) සුළු මුදල් භාරකරු ඉල්ලුම් කරන මුදල ලබා දීම.

(4) සුළු මුදල් භාරකරු මාසය අන්තිමේ ඉතිරි කර ගත් මුදලට සමාන මුදලක් භාර දීම.

35. නිවැරදි ගිණුම්කරණ සමීකරණය තෝරන්න.

(1) ප්‍රාග්ධනය + වත්කම් + වියදම් = වගකීම් + ආදායම්

(2) ප්‍රාග්ධනය + ආදායම් + වගකීම් = වත්කම් + වියදම්

(3) ප්‍රාග්ධනය + වියදම් + වගකීම් = ආදයම් + වත්කම්

(4) ප්‍රාග්ධනය + වියදම් + ආදායම් = වගකීම් + වත්කම්

36. හැමවිටම හර ශේෂයක් පවතින ගිණුම වන්නේ,

(1) ප්‍රාග්ධන ගිණුම (2) බැංකු ජංගම ගිණුම (3) පොළී ගිණුම (4) මුදල් ගිණුම

37. ගත් මිලට 25% ක ලාභයක් තබා ගෙන භාණ්ඩයක් වික්කේ නම්,

(1) විකුණුම් මිලට 33% ක ලාභයක් ඇත. (2) විකුණුම් මිලට 25% ක ලාභයක් ඇත.

(3) විකුණුම් මිලට 20% ක ලාභයක් ඇත. (4) ලාභ ප්‍රතිශතයේ වෙනසක් නොවේ.

38. ගිණුම් තුලනය කිරීම යනු,

(1) ගිණුමක දෙපැත්ත සමවන තුරු ගනුදෙනු සටහන් කිරීමයි.

(2) ගිණුමක හර බැර දෙපැත්තේ වටිනාකම් සම කිරීමයි.

(3) ගිණුමක හර වැඩිවන විට බැර පැත්තට ගනුදෙනු ලිවීමයි.

(4) ගිණුමක බැර වැඩිවන විට හර පැත්තේ ගනුදෙනු ලිවීමයි.

39. ණය ගැති, නයනජිත්ගෙන් ලැබුණු මුදල වූ රු. 2500 ඔහුගේ ගිණුමේ හරට පිටපත් කිරීමේ වරද නිවැරදි කිරීම සඳහා කළ යුතු සටහන කිමෙක් ද?

(1) නයනජිත් හර රු. 2500, මුදල් බැර රු. 2500

(2) මුදල් හර රු. 2500, නයනජිත් බැර රු. 2500

(3) නයනජිත් හර රු. 5000, අවිනිශ්චිත ගිණුම බැර රු. 5000

(4) අවිනිශ්චිත ගිණුම හර රු. 5000, නයනජිත් බැර රු. 5000

40. පොදු ලෙජරයේ ඇතුලත් වන්නේ,

(1) වියදම් හා ආදායම් ගිණුම් ය. (2) වත්කම් හා වගකීම් ගිණුම් ය.

(3) පුද්ගල නොවන අනෙකුත් ගිණුම් ය. (4) පුද්ගල ගිණුම් පමණකි.

සිසිර කුමාර